විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

AGD RPT

184
28/5

මගේ අංකය
எனது இல.
My No. ඊඑච්ජීයි/එම්එච්ඒ/ඒපීඒ /04/2017/22

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2018 මැයි 25 දින

28 MAY 2018
ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

**ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබූ විසර්ජන ගිණුම හා එම ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය w. g. n. menik

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්ජ්සී/එම්එච්ඒ/ඒපීඒ/ 04/2017/22
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2018 මැයි 25 දින

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

**ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂය සඳහා වූ 2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ඒ 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන **(i)** සිට සටහන **(iv)** දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2017 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2017 අංක **32** දරන විසර්ජන(සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 2. විගණන විෂය පථය

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන 2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කළේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.

තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම විසර්ජන ගිණුමේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

## 3. විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 125 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට පැවරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ, විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

## 4. විගණන නිරීක්ෂණ

2017 වර්ෂය සඳහා ශීර්ෂ 121 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයේ සිට 4.5 ඡේදය දක්වා වූ කරුණු දැක්වීම්වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### 4.1 වියදම් ඇස්තමේන්තු හා ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශයට අයත් ශීර්ෂ 121 යටතේ දැක්වෙන ව්‍යාපෘති 04 හි මුළු පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 11.12 ක ප්‍රතිශතයක් හා මුළු මූලධන ප්‍රතිපාදනයෙන් 48.67 ක ප්‍රතිශතයක් 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණි. සමස්ත ප්‍රතිපාදනය සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරිවීම ප්‍රතිශතය 59.79 ක් විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වියදම | ඉතිරිය | ඉතිරිවීම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන වියදම | 8,916,494,000 | 7,924,535,956 | 991,958,044 | 11.12 |
| මූලධන වියදම | 18,025,658,000 | 9,282,860,459 | 8,742,797,541 | 48.67 |
| **එකතුව** | **26,942,152,000** | **17,207,396,415** | **9,744,755,585** | **59.79** |

(අ) **ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15කට වඩා වැඩි ඉතිරිවීම**

වැය විෂයයන් 26 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 21,754,571,920 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු. 12,097,992,663 ක් විය. ඒ අනුව මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු.9,621,294,743 ක් වූ අතර, එම ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ත් සියයට 94 ත් අතර පරාසයක පැවතිණි.

(ආ) **ප්‍රතිපාදන මාරුකිරීම්**

මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වීරමොං ක්‍රියා පටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීමේදී කිසියම් වැය විෂයයක් සඳහා වර්ෂය තුල වෙන්කර ඇති ප්‍රතිපාදන මුදල් වර්ෂය තුල වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව සහ ප්‍රතිපාදන ඉක්මවා යෑමට ඉඩකඩ ඇතිබවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා සෑහීමකට පත්විය යුතුය. එසේ වුවද අවස්ථා 03 කදී වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකරගත් රු.1,824,700 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ඇ) **ප්‍රතිපාදන ඌන උපයෝජනය**

මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව පරිපූරක ඇස්තමේන්තු මගින් අවස්ථා 07ක දී රු.5,128,297,000 ක අතිරේක ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද, අතිරේකව ලබාගත් ප්‍රතිපාදන වලින් රු.2,105,871,211ක් එනම් සියයට 26 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරිවීම් ඇතිවීමට ප්‍රධාන හේතුව මහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම වශයෙන් ලේකම්වරයා විසින් අදහස් දක්වා තිබුණි.

## 4.2 පොත්වලින් කපා හැරීම පිළිබඳව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් වාහන අනතුරු 09 ක් හා 13 ක් සම්බන්ධයෙන් අලාභ හානි හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණු අතර , එම අලාභ හානිවල වටිනාකම් විසර්ජන ගිණුමේ දැක්වීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 4.3 බැරකම් හෙළිදරව් කිරීම

2018 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේදී අවස්ථා 52 ක දී රු. 426,881 ක බැරකම් විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

## 4.4 නිරවුල් නොකරන ලද පොදු තැන්පත්

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන්පත් අනුව පොදු තැන්පත් ගිණුම් අංක 6000/0000/00/0008/0012/000 යටතේ රු.955,688 ක ආරම්භක හා අවසාන ශේෂයක් දක්වා තිබුණි. එසේ වුවද, ඉකුත් වර්ෂයේ අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මෙවැනි ශේෂයක් නොමැති තත්ත්වයක් යටතේ තැන්පත් ගිණුම නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව

2016 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව රු.17,141,418 ක් වූ වත්කම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. එසේ වුවද, 2017 වර්ෂයේදී රු.13,219,005 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම හා වටිනාකම රු. 669,197 ක් අර්ධ පරිභෝජන භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් රු. 3,253,216 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 5. පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම.

-----------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් ශීර්ෂ 121 ට අදාළව මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඩබ්.ජී.එන්.මැණිකේ
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය w. g. n. menike